# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

# Public Sector Efficiency Project

## රාජ්‍ය ආයෝජන හැසිරවීමේ කාර්යසාධන බලකාය

## [Public Investment Delivery Task Force (PIDTF)]

## කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ක්‍රමෝපාය ව්‍යාපෘති වැඩි ඒකාබද්ධතාවයකින් සහ දැඩි සුපරීක්ෂාකාරී හා අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික පදනම සම්පාදනය කිරීම සඳහා රාජ්‍ය ආයෝජන හැසිරවීමේ කාර්යසාධන බලකායක් [Public Investment Delivery Task Force (PIDTF)] ස්ථාපනය කර ඇත. මෙම රාජ්‍ය ආයෝජන කමිටුව රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ (Public Sector Efficiency Project) සංරචයක් ලෙස ක්‍රියාත්මක වේ.

එම ඒකකයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS2) - තනතුරු 01**

මූලික සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3ලෙස දක්වා ඇති සුදුසුකම් වලින් එකක්)

1. සාර්ථක ලෙස නිම කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධිය හා සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබා ඇති සාර්ථක ලෙස නිමකරන ලද වෘත්තීය සුදුසුකමක්

   සමඟ

   කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 11ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහ ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක්

   සහ

   අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගෙන ඇති පූර්ණ සාමාජිකත්වය

   සමඟ

   කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

3. පළමු ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද

සමඟ

රජයේ දීප ව්‍යාප්ත සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමේ තනතුරක් දරන තැනැත්තකු වීම

වැටුප: රුපියල් 145,000- 160,000

**ව්‍යාපෘති විශේෂඥ (ඉඩම් අත්පත් කරගැනීම්, සිවිල් ඉංජිනේරු, නීති) (PS3) - තනතුරු 03**

මූලික සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3ලෙස දක්වා ඇති සුදුසුකම් වලින් එකක්)

1. සාර්ථක ලෙස නිම කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධිය හා සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබා ඇති සාර්ථක ලෙස නිම කරන ලද වෘත්තීය සුදුසුකමක්

   සමඟ

   කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහ ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක්

   සහ

   අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබා ගෙන ඇති පූර්ණ සාමාජිකත්වය

   සමඟ

   කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

3. පළමු ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද

   සමඟ

   රජයේ දීප ව්‍යාප්ත සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමේ තනතුරක් දරන තැනැත්තකු වීම

වැටුප: රුපියල් 140,000- 155,000

**පොදු කොන්දේසි**

අ) වයස් සීමාව

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

ව්‍යාපෘති විශේෂඥ - වයස අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

ආ) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

**වැටුප සහ අනිකුත් වරප්‍රසාද**

අංක 01/2016 සහ 2016.03.24 දිනැති රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛය හා අනිකුත් අදාල රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ මත වැටුප් පදනම් වේ.

**සේවා කොන්දේසි සහ නියමයන්**

දැනට රාජ්‍ය සේවයේ, පළාත්පාලන ආයතන ද ඇතුළත් පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් ම රජය සතු සමාගම්හි සේවයේ නියුතු තැනැත්තන්, වැටුප් රහිත පදනමින් පූර්ණකාලීන ව මුදා හැර ගැනීම මත බඳවාගනු ලබන අතර රාජ්‍ය සේවයෙන් පරිබාහිර තැනැත්තන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. බඳවාගැනීම මුලින් එක් අවුරුදු කාලසීමාවක් සඳහා වන අතර සාර්ථක කාර්යසාධනය මත එය දීර්ඝ කළ හැකි වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් (කෙටි ලැයිස්තුගත කරන අයදුම්කරුවන් පමණක්) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත්‍රය**

අයදුම්කරුවන් සිය අයදුම්පත්‍රය සමඟ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර සහ අනිකුත් අදාල තොරතුරු ද සමඟ සම්බන්ධ කරගත හැකි දුරකතන අංකයන්ද, විද්‍යුත් තැපැල් ලිපිනය (විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම් පමණක්) සහ ඥාති නොවන යොමුලදුවන් දෙදෙනකු සම්බන්ධ කරගත හැකි තොරතුරු ද ඇතුළත් ජීව-දත්ත පත්‍රිකාවක් එවිය යුතු වේ. එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන් වෙන් කවරයන්හි බහා ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට **හෝ** addi.sec.planning@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට 2018.08.03 වන දිනට පෙර එවිය යුතු වේ. තැපැල් මගින් යොමු කරන්නේ නම් ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ/ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා එවිය යුතු අතර ප්‍රගමන පිටපතක් පහත ලිපිනයට කෙළින්ම යොමුකළ යුතු වේ.

**ලේකම්**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**
**1 වන මහල, "මිලෝදා" ගොඩනැගිල්ල**
**බ්‍රිස්ටල් වීදිය**
**කොළඹ 01**

වැඩිදුර විස්තර සඳහා දුරකතන අංක 011 4461609 අමතන්න.